# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය !
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 11
NUMBER 01

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

APRIL 10, 2008 අප්‍රියෙල් මාසය (බුද්ධ වර්ෂ 2551 බක් මාසය)


# ඔහොම යං...!

**සංජය විමලරත්න විසිනි**

**ත**ව නොබෝ දිනකින් අපේ සිංහළ අවුරුදු දිනය උදාවෙයි. ගමේ බාසාවෙන් කියනවා නම් දොළොස් මහට යන දා ය. හැකි අයුරින් අඩුවැඩි ප්‍රමාණයට චාරිත්‍රානුකූලව අළුත් අවුරුද්ද ශුභ මොහොතින් සිදුකෙරේ. ගතවී යන අවුරුද්ද ගැන සිතීමත්, ඉදිරිය ගැන අදිටන් කර ගැන්මත් සඳහා එළඹෙන පුණ්‍ය කාලය යොදා ගැන්ම ද පැරණි සිරිතකි. කෙසේ වුවද මේ අවස්ථාවේ අප රට සහ ජනතාව ගැන යම් සමාලෝචනයක යෙදීමට මේ කදිම අවස්ථාවකි.

පසුගිය වසර තුළ අප රට ජාතික ප්‍රශ්නය අතින් සැහෙන ප්‍රමාණයකට ඉදිරියට ගිය බව දැක්ම සතුටකි. නැගෙණහිරෙන් කොටි පළවා හැරීමෙන් පසු ඒ පෙදෙස තුළ යම් ස්ථාවරයක් ඇතිකර ලීමට ද, පළාත් සභා ඡන්ද සාමකාමීව පැවැත්වීමට පියවර ගැන්ම ද, කාලයක් තිස්සේ දුක්විඳි එම ජනතාවට හැකි පමණ සහන සැලසීමට රජය පියවර ගැනීම ගැනද ප්‍රසාදය පළකළ යුතුය. කොටින්ගේ අවි සහ මැර බලයට යටත් නොවී යම් පමණකට සාමයක රසවිඳීමටත් ප්‍රජාතන්ත්‍රීය ලෙස ස්ථාවර බවකින් ඉදිරිය බැලීමටත් ඒ ජනතාව අවස්ථාව ලැබීය.

මේ අවධියේ තැබුණ අනෙක් වැදගත් පියවරක් නම් කොටියා මේ සම්ම ජාතියේ පරාජය කළ නොහැ කිය යනුවෙන් පසුගිය වසර 15 තුළ ගොඩ නැගී තිබුණු දුර්මතය මිත්‍යාව බිඳ හෙළීමය. විදේශ ගැති **NGO** කාරයනුත්, විදේශ මුදලින් යැපෙමින් පණ්ඩිත මත ප්‍රකාශකරන මහ ලොකු විමර්ශකයින් (Analysts) ලෙස මාධ්‍ය කාරයින් හඳුන්වන බක පණ්ඩිතයින් හා සාම කාක්කන් ආදීන් ගොඩ නගා තිබුණු බොරුව කුඩුපට්ටන් කිරීමට අප හමුදා සමත්වූහ. මේක කවදාවත් ඉවර වෙන යුද්ධයක් නොවේ යයි යුද්ධය වවාගෙන කන්නට බැලූ මේ බොහෝ දෙනා හා සමහර දේශපාලකයින්ගේ ද කටවල් වැස්සවීමට ද නැගෙණහිරින් කොටි පළවා හැරීමට ද පසුගිය සුළු කාලය තුළ හා දැනට උතුරේ ක්‍රමයෙන් ඉදිරියට ගෙනයනු ලබන සටන ද හොඳ සාක්ෂි වෙති.

## අළුත් අදිටනක්

ඒ මිත්‍යාව වෙනුවට කොටි විනාශකර රට මුදාගත හැකිය, එය කළ යුතුය යන අධිෂ්ඨානය ජනතාව තුළ දැන් ගොඩනැගී ඇත. මේ නිසාම දැන් ඒ සටන සඳහා ජනතා වගේ පූර්ණ සහයෝගය ලැබේ. මේ යුද්ධය මෙහෙයවන දේශපාලනඥයින්, පාලක යන්, සෙන්පතීන් හා හමුදා භටයින් ආදී සියල්ලන් එකා මෙන් එහි යෙදී සිටින බව දකින ජනතාව ද ඉත සිතින් සතුටු වෙති. සටන සාර්ථකව කළ හැකිවී ඇත්තේ ඒ නිසාය. එසේම මේ යුද්ධ පරිශ්‍රමය නිසා වියදම් වැඩිවීමද, එයට සමානුපාතිකව ජනතාවට අගහිඟකම්, අමාරුකම් සහ ජීවන වියදම නැගීම ආදී සියල්ලද සිදුවෙයි. එසේ වුවද ජනතාව එය උසුලා ඉවසා සිටින්නේ මේ සටන අවසන් කරගෙන කොටි ව්‍යසනයෙන් අප සැවොමත්, අනාගත පරම්පරාවලුත් මුදවා ගැන්මේ පිරිසිදු බලාපොරොත්තුවෙනි. මෙය අප රටේ පාලකයින් තරයේ සිතට ගෙන කටයුතු කළ යුතු ය.

මේ සමගම අප අතරේම කඩිමුඩිකාරයින්ද සිටිති. ඉන් සමහරු "ඉතින් තවම මහ කොටියා අල්ලන්න බැරිවුණා නේ, මහ කොටි කඳවුරු විනාස කරන්න බැරිවුනා නේ" යනුවෙන් මැසිවිලි කියති. "මාස කීපෙකින් යුද්ද ඉවරකරනවාය කිව්වා කෝ තවම ඉවර නැනේ." කියා ආඩපලි කියති. ඔවුන් ඒවා කියන්නේ දුරදිග සිතා නොබලා ය. නමුත් ඒ අතරම එවැනි සැක ජනතාව අතර පතුරුවා දැන් යන සටන මොට කරදැමීමට වෑයම් කරන දේශද්‍රෝහී තක්කඩියන් ද නැත්තේ නොවේ. මීන් සමහරු මාධ්‍යකරුවෝ වෙති. මුන් දුටු තැන ලොප්කර පසෙකට තල්ලු කර දැමිය යුතු ය. උන් අප අතරේ සිටිනා සතුරන් බැවිනි.

කවුරු කෙසේ කීවද අප හමුදා සෙමින් වුව ද නියත වශයෙන් ක්‍රමානුකූලව පියවරෙන් පියවර ඉදිරි යට යමින් සිටින බව නම් සත්‍යයකි. පසුගිය මාසයේ (මාර්තු) අප පුවත් පතේ මුල් පුවතේ අප දැක් වූ පරිදි ලන්ඩනයේ පළවන ජාත්‍යන්තර වශයෙන් ලොව ඉහළින් පිළිගැනෙන විමර්ශන වාර්තාවේ **( Janes Intelligence Review)** සඳහන් කර තිබුණු පරිදි කොටි දිගටම පසුබසිමින් සිටින බවද, රජයේ හමුදා ඉදිරියට යන බවද සනාථ කරලයි. යුද්ධයක් යනු කාලයක් පිළිබඳ න්‍යාය පත්‍රයක් අනුව කළ හැකි දෙයක්

**කරුණාකර 4 වන පිටුව බලන්න →**

**අප පාඨක සියළුදෙනාට සුබ සිංහළ අළුත් අවුරුද්දක් වේවා !**
**TO ALL OUR READERS A HAPPY SINHALA NEW YEAR !**



**චිත්‍රය - තලන්ගම ජයසිංහ Art - Talangama Jayasinghe - *Sri Lanka***

සියුම් හඬින් හඬත කොහා තුරු මුදුණේ වහා
නැවුම් දිනක් සුබ නැකතක් එළඹේ බක් මහා
කැවුම් කෙසෙල් කිරිබත් මුසු හෙළ අවුරුදු රහා
එවම් තුටින් වෙසෙන ඔබට සත් සයුරෙන් එහා

♦ *දයා ආනන්ද රණසිංහ*

**ලංකාවිත්ති වෙබ් අඩවිය http://www. lankaheritage.com/lankaviththi/**




අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට
සාමය සතුට පිරි,
සුබ නව වසරක් වේවා!

MCG
FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3